

# ව්‍යාපාර අධ්‍යයනය

## 12 ශ්‍රේණිය

## ඒකක අවබෝධ පිරික්සුම



The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa

## නිපුණතා මට්ටම 13.1

1. මෙහෙයුම් කළමනාකරණය අර්ථ දක්වන්න.
2. මෙහෙයුම් කළමනාකරණය නිෂ්පාදන කළමනාකරණයෙන් වෙනස් වන්නේ කෙසේ ද ?
3. මෙහෙයුම් කළමනාකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.
4. තෝරාගත් බේකරි නිෂ්පාදන කටයුත්තකට අදාළ නිෂ්පාදන ක්‍රියාවලිය එහි එක් එක් අදියරයන් සඳහා උදාහරණ සහිත ව සටහනකින් ඇඳ දක්වන්න.
5. ඇඟළුම් කර්මාන්ත ශාලාවකට අදාළ නිෂ්පාදන ක්‍රියාවලිය එහි එක් එක් අදියරයන් සඳහා නිදසුන් සහිත ව සටහනකින් ඇඳ දක්වන්න.
6. මෙහෙයුම් කළමනාකරණයට අයත් කාර්ය නම් කරන්න.
7. නිෂ්පාදන ඉංජිනේරුකරණය යනු කුමක් ද ?
8. නිෂ්පාදන සැලසුම්කරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?
9. ඔබ කිසියම් නිෂ්පාදන ආයතනයක හිමිකරු යැයි සිතන්න. නිෂ්පාදනය සැලසුම් කිරීමට ඔබට අවශ්‍යව ඇත. මෙහිලා ඔබ අවධාරණය කළ යුතු කරුණු ලැයිස්තු ගත කරන්න?
10. නිෂ්පාදන ආයතනයක් ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී සැලකිය යුතු කරුණු පහක් ලියන්න
11. මෙහෙයුම් කළමනාකරණයට අයත් කාර්යයක් වන පර්යේෂණ හා සංවර්ධනය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද ?
12. නිෂ්පාදන ආයතනයකට පර්යේෂණ හා සංවර්ධනය කටයුතු වැදගත් වීමට හේතු හතරක් සඳහන් කරන්න.

e තක්සලාව කල්விக்கூடம் TM
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිපුණතා මට්ටම 13.2

1. කුමාරි රෙදි කැබලි භාවිතයෙන් පාපිසි නිර්මාණය කරන්නියකි. ඇය තම පුතා මඟින් මෙම පාපිසි නගරයේ තොග කඩයට සපයන අතර ඇතැම් විට ඇයට ලැබෙන ඇණවුම්වලට විවිධ වර්ගයේ නිර්මාණ ද ඉල්ලුම්කරුවන්ට ලබා දෙයි.

    (අ) මෙම ආයතනයේ නිෂ්පාදන කටයුතු කුමන නිෂ්පාදන ක්‍රමයකට අයත් ද ?

    (ආ) මෙම නිෂ්පාදන ක්‍රමයේ හිතකර ලක්ෂණ මොනවාද ?

2. ඇඳුම් නිෂ්පාදනයේ යෙදී සිටින ආයතනයක් ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම මත ඔවුන්ට අවශ්‍ය ආකාරයට ඇඳුම් මසා අලෙවි කරයි. මෙම ආයතනයේ අනුගමනය කරන නිෂ්පාදන ක්‍රමය නම් කර එම ක්‍රමයේ විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

3. ඡායාරූප ශිල්පී රවීන්, ලැබෙන ඇරයුම් මත විවිධ උත්සව අවස්ථා ඡායාරූප ගත කරනු ලබන වෘත්තීය ඡායාරූප ශිල්පියකි.'' ඡායාරූප ශිල්පී නවීන් ක්‍රියාත්මක කරන නිෂ්පාදන ක්‍රමය නම් කරන්න.

4. කාර්ය / ඇණවුම් මත නිෂ්පාදනය අනෙක් නිෂ්පාදන ක්‍රමවලින් එය වෙනස් වීමට පදනම් වන නිර්ණායක මොනවා ද ?

5. නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී ආයතනයක් විසින් සලකා බැලිය යුතු නිර්ණායක හතරක් සඳහන් කරන්න.

6. ප්‍රවාහ නිෂ්පාදනයේ හිතකර ලක්ෂණ දෙකක් දක්වන්න.

7. මෙහෙයුම් පිරියත සැලසුම් කිරීම කෙටියෙන් හඳුන්වන්න ?

8. නිෂ්පාදිත ආයතනයක පිරියත සැලැස්මේ වැදගත්කම පැහැදිලි කරන්න.

9. නිෂ්පාදිත කර්මාන්ත ආයතනයක නිෂ්පාදන පිරියත නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු හතරක් ලියන්න.

10. මෙහෙයුම් ක්‍රියාවලියේ දී සාමාන්‍යයෙන් යොදා ගැනෙන පිරියත ක්‍රම තුනක් නම් කර ඒවා වෙන වෙන ම නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

11. ක්‍රියාවලි පිරියත නිෂ්පාදිත පිරියත හා සසඳන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# නිපුණතා මට්ටම 13.3

සමච්ඡේද ලක්ෂ්‍යය (*Break even point*) යනුවෙන් අදහස් වන්නේ කුමක් ද ?

ව්‍යවසායකයෙකු වන දෙව්සික ඔහුගේ නිෂ්පාදනය සම්බන්ධ පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

| | | |
|---|---|---|
| නිෂ්පාදනය කළ සමස්ත භාණ්ඩ ප්‍රමාණය | (ඒකක) | 10 000 |
| ඇස්තමේන්තු කළ විකුණුම් වටිනාකම | (රු.) | 1000 000 |
| විචල්‍ය පිරිවැය | (රු.) | 600 000 |
| ස්ථාවර පිරිවැය | (රු.) | 200 000 |

ඉහත තොරතුරු පදනම් කරගෙන පහත සඳහන් දෑ ගණනය කරන්න.

1. ලාභය 2. දායකය 3. සමච්ඡේදන ලක්ෂ්‍ය

දිමුතු පාවහන් නිපදවීමේ සමාගමට අදාළව සත්‍ය හා පුරෝකථනය කරන ලද තොරතුරු පහත වගුවේ දක්වේ.

| විස්තරය | 2020 ^සත්‍ය) | 2021 ^පුරෝකථනය) |
|---|---|---|
| පාවහන් යුගල (ඒකක) | 500 | 1 000 |
| ස්ථාවර පිරිවැය | රු. 212 000 | 50% කින් වැඩි වේ |
| විචල්‍ය පිරිවැය ( පාවහන් යුගලක) | රු. 200 | රු. 200 |
| විකුණුම් මිල ( පාවහන් යුගලක) | රු. 730 | රු. 730 |

2021 වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න.

(අ) මුළු නිෂ්පාදන පිරිවැය

(ආ) පාවහන් යුගලක නිෂ්පාදන පිරිවැය

(ඉ) සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක ප්‍රමාණය

(ඊ) 2020 වර්ෂයට සාපේක්ෂව සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක ප්‍රමාණයෙහි වෙනස

චිරන්දිත්ගේ ව්‍යාපාරයේ මුළු ස්ථාවර පිරිවැය රු. 60 000 /- ඒකකයක විකුණුම් මිල රු.60 /- කි. මුළු විචල්‍ය පිරිවැය රු. 30 000 /- කි. වෙළෙඳ පිරිවැටුම රු.60 000 /- කි. මෙම ව්‍යාපාරයේ සමච්ඡේද ලක්ෂයට අදාළ නිෂ්පාදන ඒකක ගණන කොපමණ ද ?

සුළු හා මධ්‍යපරිමාණ ව්‍යාපරිකයින් සඳහා දේශනයක් පවත්වන ඔබ සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහයේ වැදගත්කම

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිපුණතා මට්ටම 13.4/13.5

### නිපුණතා මට්ටම 13.4

1. මිල දී ගැනීමේ ක්‍රියාවලියේ පියවර දක්වන්න.
2. ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් දක්වන්න.

### නිපුණතා මට්ටම 13.5

1. නිෂ්පාදන ආයතනයකිතොග පාලනය' යනුවෙන් කුමක් අදහස් කෙරේ ද?
2. මනා තොග පාලනයකින් ව්‍යාපාරයකට ලබා ගත හැකි වාසි දෙකක් විස්තර කරන්න.
3. තොග පාලනය සඳහා යොදා ගැනෙන ක්‍රම දෙකක් නම් කරන්න.
4. පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

   (අ) ABC විශ්ලේෂණය

   (ආ) අඛණ්ඩ ව තොග වාර්තා කිරීමේ ක්‍රමය

   (ඇ) තොග මට්ටම නිශ්චය කිරීමේ ක්‍රමය
5. ද්විත්ව භාජන ක්‍රමය හඳුන්වා එයට ප්‍රයෝගික උදාහරණයක් ලබාදෙන්න.
6. JIT ( Just-In-Time) නිෂ්පාදන ක්‍රමය යනු කුමක් දැයි එම ක්‍රමය අනුගමනය කිරීමෙන් නිෂ්පාදකයෙකුට ලැබෙන ප්‍රතිලාභ සඳහන් කරන්න.
7. තොග පාලනය කිරීමේ ක්‍රමයක් ලෙස (JIT) ක්‍රමය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.
8. තොග පිරිවැය අවම කර ගැනීම සඳහා JIT ක්‍රමය ඉවහල් වන අකාරය පැහැදිලි කරන්න.
9. JIT ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ආයතන මුහුණ දෙන බාධක කෙටියෙන් පැහැදිලි කරන්න.

e තක්සලාව කල්விக்கூடம் ™
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිපුණතා මට්ටම 13.6

තොග මට්ටම් ගණනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු  දෙකක් දක්වන්න.

1. පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

(අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ)

(ආ) අවම තොග මට්ටම

(ඇ) පොරොත්තු කාලය

(ඉ) උපරිම තොග මට්ටම

(උ) චක්‍රීය කාලය

3. අවම තොග මට්ටමට වඩා ගබඩාවේ තොගය පහළ ගියහොත් අත්විඳීමට සිදු විය හැකි අහිතකර ප්‍රතිඵල දෙකක් දක්වන්න.

4. උපරිම තොග ප්‍රමාණය ඉක්මවා තොග රැස් කිරීම නිසා අත්විඳීමට සිදුවිය හැකි අහිතකර ප්‍රතිඵල දෙකක් දක්වන්න.

e තක්සලාව ™
கல்விச்சுடம்
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිපුණතා මට්ටම 13.7

1. ඇණවුම් පිරිවැය හා නඩත්තු පිරිවැයට ඇතුළත් කරන වියදම් අයිතම දෙක බැගින් සඳහන් කරන්න.
2. වී තොග අලෙවි මධ්‍යස්ථානයක තොග පවත්වාගෙන යාමට අදාළ වියදම් සම්බන්ධ තොරතුරු පහත සඳහන් වේ. (වටිනාකම රුපියල් දහස්වලිනි)
    - එක් ඇණවුමක් සඳහා පිරිවැය 50/-කි.
    - කාලච්ඡේදයේ තොග අවශ්‍යතාව ඒකක 10000කි.
    - එක් ඒකකයක් කාලච්ඡේදය පුරා පවත්වාගෙන යාමේ පිරිවැය රු. 100කි.
3. ඉහත තොරතුරු ඇසුරින් ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරන්න.
4. ව්‍යාපාරයක ශ නැමති ද්‍රව්‍ය අයිතමය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.
    - වාර්ෂික ද්‍රව්‍ය පරිභෝජනය ඒකක 12 000
    - ඒකකයක පිරිවැය රු. 100
    - එක් ඇණවුමක් කිරීම සඳහා යන පිරිවැය රු. 300
    - තොග රඳවා ගැනීමේ වාර්ෂික පිරිවැය ඒකකයකට රු.5
5. ඉහත තොරතුරු ආශ්‍රයෙන් ශ ද්‍රව්‍ය සඳහා ආර්ථික ඇණවුම් ප්‍රමාණය (ැඛු) ගණනය කරන්න.
6. සචිත් රබර් භාණ්ඩ නිෂ්පාදන ආයතනයේ තොග සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| මාසික රබර් පරිභෝජනය | කි. ග්‍රෑ. 6000 |
| ඒකකයක ඇණවුම් පිරිවැය | රු. 100 |
| ඒකකයක වාර්ෂික නඩත්තු පිරිවැය | රු. 10 |
| ඒකකයක ගැණුම් මිල | රු. 50 |

7. ආර්ථික ඇණවුම් ප්‍රමාණය (ැඛු) ගණනය කරන්න.
8. ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කිරීමේ වැදගත්කම සඳහන් කරන්න.
9. නිෂ්පාදන ආයතනයක ආර්ථික ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීමේ දී මුළු පිරිවැය, ඇණවුම් කිරීමේ පිරිවැය හා තොග පවත්වාගෙන යාමේ පිරිවැය කිනම් ස්වරූපයක් ගන්නේදැ යි ප්‍රස්තාර සටහනකින් පැහැදිලි කරන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිපුණතා මට්ටම 13.8

1. නිමැවුමේ ගුණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.
2. නව නිර්මාණ කරන ආයතන නිෂ්පාදිතවල ගුණත්වය ඉහළ දැමීමට අපේක්ෂා කරයි. ගුණත්වය ඉහළ දැමීමට ඔවුන් විසින් එකතු කළ යුතු අංගෝපාංග මොනවාදැයි නම් කරන්න.
3. ආයතනයකට ගුණත්ව පාලනය වැදගත් වීමට හේතු දෙකක් දක්වන්න
4. තත්ත්ව පාලනය (Quality Control) අර්ථ දක්වාල එමඟින් ව්‍යාපාර ආයතනයකට ලැබෙන ප්‍රතිලාභ සඳහන් කරන්න.
5. තත්ත්ව ආරක්ෂණය යනුවෙන් කුමක් අදහස්වේ ද ?
6. නිෂ්පාදන ආයතනයක සිදු වන තත්ත්ව පාලනය යනු කුමක්දැයි හඳුන්වාල තත්ත්ව පාලනය සඳහා භාවිත කළ හැකි ශිල්ප ක්‍රම මොනවාදැයි සඳහන් කරන්න.
7. පහත සඳහන් සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය

(ආ) තත්තව කව (Quality Circles)

(ඇ) ශූන්‍ය දෝෂ (Zero Defects)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## නිපුණතා මට්ටම 13.9

3. නව නිෂ්පාදන තාක්‍ෂණය යොදා ගැනීම තුළින් බොහෝ ආයතනවල ඵලදායකත්වය වැඩි වී ඇත.” ඵලදායකත්වය (Productivity) යන සංකල්පය පැහැදිලි කරන්න.
4. ව්‍යාපාරයකට ඵලදායීතාව වැදගත්වන්නේ ඇයි දැයි යන්න දැක්වීමට හේතු හතරක් සඳහන් කරන්න.
5. ද්‍රව්‍ය ඵලදායීතාව වර්ධනය කළ හැකි ආකාර හතරක් සඳහන් කරන්න.
6. සංවිධානයකට යාන්ත්‍රික ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.
7. සංවිධානයකට ශ්‍රම ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.
8. මෙහෙයුම් ක්‍රියාවලියට යොදා ගන්නා නව තාක්ෂණ ක්‍රම හතරක් නම් කරන්න.
9. පරිගණක ආධාර නිර්මාණය (CAD), පරිගණක ආධාර නිෂ්පාදනය (CAM), පරිගණක සමෝධානික නිෂ්පාදනය (CIM) පරිගණක අංකිත පාලනය (CNC) යන නව නිෂ්පාදිත ක්‍රම ව්‍යාපාර ආයතනවල මෙහෙයුම් කළමනාකරණ ක්‍රියාවලිය වඩා කාර්යක්‍ෂම කර ගැනීමට යොදා ගනී. මෙම තාක්‍ෂණ ක්‍රමවලින් ඕනෑම දෙකක් තෝරාගෙන ඒවා මෙහෙයුම් ක්‍රියාවලියට යොදා ගන්නා ආකාරය වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න.
10. කර්මාන්තශාලවක් පවත්වාගෙන යන භවන්ත නව තාක්ෂණය සම්බන්ධයෙන් එතරම් දැනුවත්වීමක් නොමැති අතර නව තාක්ෂණයට අනුගතවීමට ද කැමැතැත්තක් නොදක්වයි. නව තාක්ෂණය යොදා ගැනීම මඟින් භවන්තට අත්වන ප්‍රතිලාභ පිළිබඳව ඔහු දැනුවත් කරන්නේ කෙසේ ද?
11. නව තාක්ෂණය යොදා ගැනීමේ ගැටලු හතරක් සඳහන් කරන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk